ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82

දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සැම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා
නිකුත් කරන මාසික දහම් කලාපය.

# බෞද්ධෝදය

79 වර්ෂය - ශ්‍රී බු: ව 2569 2025 නොවැම්බර් 05 ඉල් කලාපය

**ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරය ප්‍රමුඛ අෂ්ඨ මහා විහාරාධිපති,**
**දෙහිවල ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනාධිපති,**
**කොළඹ නාලන්ද මහානාම විද්‍යාලවල හිටපු ධර්මාචාර්ය,**
**ශාස්ත්‍රපති, පණ්ඩිත, පූජ්‍ය, ලේල්වල සමිත ස්වාමීන්වහන්සේ**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

# “උපාසක උපාසිකාවන් කළ යුතු දේ”

**“යතෝ ඛෝ මහානාම, උපාසකෝ බුද්ධං සරණං ගතෝ හෝති, ධම්මං සරණං ගතෝ හෝති, සංඝං සරණං ගතෝ හෝති, එත්තාවතා ඛෝ මහානාම උපාසකෝ හෝති ”**

**(අංගුත්තර නිකාය, අට්ඨක නිපාත, මහානාම සූත්‍රය)**

සුපින්වතුනි,

බුදුහාමුදුරුවෝ කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයේ වැඩ වාසය කරන කාලෙ මහානාම ශක්‍යයා උන්වහන්සේ වෙත පැමිණ වැඳ, එකත්පසෙක හිඳ, “ස්වාමීනි, උපාසකයෙකු වීමට අවශ්‍ය කරුණු මොනවාද?” යනාදී වශයෙන් ප්‍රශ්න කිහිපයක් ඇසුවා. ඊට පිළිතුරු වශයෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළ මහානාම සූත්‍රයේ ඇතුළත් වන පාඨයක් තමයි මෙහි මාතෘකාව ලෙස සඳහන් කළේ. මහානාම ශාක්‍ය කියන්නේ සිදුහත් කුමාරයාගේ ඥාති සහෝදරයෙක්, අනුරුද්ධ මහරහතන් වහන්සේගේ වැඩිමල් සහෝදරයා. සුද්ධෝදන රජතුමාගේ සහෝදරියගේ පුතා. ඒ වගේම මිහිරි `රස ආහාර සංඝයාට ලබාදෙන අය අතර අගතැන ලැබුවෙත් මහානාම ශාක්‍යයා. ‘උපාසක’ යනුවෙන් හඳුන්වන්න සුදුසු කාවුද කියල මේ සූත්‍රයේ පැහැදිලි

කරල තියෙනව. පන්සලට ආවත් නැතත්, සිල් ගත්තත් නැතත්, බණ ඇහුවත් නැතත්, දන් දුන්නත් නොදුන්නත්, බෞද්ධ පවුල්වල ඉන්න කාන්තාවන්ට, 'උපාසිකාව, උපාසක අම්මා යනුවෙනුත්, පිරිමින්ට, උපාසක තුමා, උපාසක මහත්තයා,'' යනුවෙන් අමතන පුරුද්දක් අපේ රටේ මහා සංසරත්නය තුළ තියෙනවා. දහමට අනුව බැලුවොත් ඒ හැම දෙනා තුළම උපාසක ගුණ නොතිබෙන්න පුළුවන්.

"උපසංකමතීති උපාසකෝ" යනුවෙන් තෙරුවන් කරා නිතර එළඹෙන තැනැත්තා/තැනැත්තිය 'උපාසක' ලෙස අටුවාවන්හි දක්වල තියෙනව. තෙරුවන් කරා එළඹෙනවා කියන්නේ ශ්‍රද්ධාව ඇතිකරගෙන බණ අහන්න, දන් දෙන්න, සිල් රකින්න යොමු වෙනවා කියන එකයි. බුද්ධං සරණං ගච්ඡාමි....'' ආදී වශයෙන් කීව පමණින් තෙරුවන් සරණ ගියා වෙන්නේ නැහැ. වෙන දේවල් ගැන හිත හිතා වුණත් අපට කටපාඩමින් ඔය වචන ටික කියන්න පුළුවන්. එහෙම කිව්වට 'උපාසක' තත්වය ලැබෙන්නේ නැහැ. උපාසක බවට පත්වන කෙනෙකු මුලින්ම කළ යුත්තේ ගුණ දැනගෙන තෙරුවන් සරණ යාමයි.

තෙරුවන් ගුණ හඳුනා ගන්නා විට ඔහු තුළ තෙරුවන්ගේ ශ්‍රේෂ්ඨත්වය ගැන පැහැදීමක් හට ගන්නවා. ශ්‍රද්ධාව කියන්නේ ඒ පැහැදීමටයි. තෙරුවන් ගැන ගුණ දැනගෙන පැහැදුනු කෙනා බුදුන් වඳිනවා. ධර්මය ඉගෙන ගන්නාවා, බණ අහනවා. බණ පොත් කියවනවා. ධර්මය සාකච්ඡා කරනවා. එසේ කරන විට ඔහුට/ඇයට ධර්මය මතක හිටිනවා. ඊට පස්සේ තම මතකයේ තිබෙන දහම් කරුණු ගැන සිතෙන් විමසා බලනවා. එකම කරුණක් දෙතුන් පළක විවිධ ක්‍රමවලින් විස්තර කර තිබෙන හැටි ගැන අවධානය යොමු කරනවා. ගැටළුවක් මතු වුණොත් සූත්‍ර, අභිධර්ම පිටක කියවා බලනවා. ධර්මධරයන්ගේත් අසා බලනවා. මෙහෙම කරනකොට ඔහුට/ඇයට ධර්මය වැටහෙන්න පටන් ගන්නවා.

ධර්මය වැටහෙන කොට ඒ අනුව ජීවත්වෙන්න ආශාව ඇති වෙනවා. බණ භාවනා කරන්න කාලය වෙන් කරගෙන උත්සාහ කරනවා. බලවත් වීර්යය උපදවා ගන්නවා. මෙහෙම දිගු කලක් කරගෙන යනකොට ධර්මය අවබෝධ වෙනවා. (මජ්ඣිම නිකාය චාකී සූත්‍රය) මෙන්න මේ විධියට උපාසකයා තමන්ගේ ජීවිතය සකස් කර ගන්න ඕන.

ඊළඟට මහානාම ශාක්‍යයා "ස්වාමීනි, තෙරුවන් සරණ ගිය උපාසකයා සිල්වතෙකු බවට පත්වන්නේ කොහොමද?'' කියා ඇසුවා.

"මහානාමය, උපාසකයා ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, මුසාවාදය, සුරාපානය යන මේ දුසිරිත් පහෙන් වැලකී ඉන්නවා නම් ඔහු සිල්වතෙක්'' බුදුහාමුදුරුවෝ වදාළා. එහෙම නම් පින්වතුනි උපාසක බවට පත් වූ කෙනෙක් පන්සිල් කඩ නොකර ආරක්ෂා කරන්න ඕන. ඒ නිසානේ අදටත් අපි තිසරණ සහිත පන්සිල් සමාදන් වෙන්නේ. පන්සිල්වලින් නතර නොවී ඊට වඩා උසස් ශීලයන් රකින්නත් උපාසකයන් යොමු වෙන්න ඕන.

"ස්වාමීනි, සමහර උපාසිකා උපාසිකාවන් තමන්ගේ යහපත ගැන උනන්දු වෙනවා. අනුන්ට යහපතක් කරන්න උනන්දු වෙන්නේ නැහැ. ඒ කොයි වගේ අයද?''

"මහානාමය, සමහර උපාසකයන් තමා තුළ ශ්‍රද්ධාව ඇතිකර ගන්නවා. අනුන් තුළ ශ්‍රද්ධාව ඇතිකරවන්න කටයුතු කරන්නේ නැහැ. තමන් දන් දෙනවා, බණ අහනවා. සිල් රකිනවා,

ධර්මය මතක තබාගෙන එහි අර්ථ පරීක්ෂා කරනවා. ඒ ධර්ම ප්‍රතිපදාවෙ යෙදෙනවා. ඒ වුණත් අනෙක් අයව දන් දෙන්න, බණ අහන්න, සිල් රකින්න, ධර්මය ඉගෙනගන්න යොමු කරවන්නේ නැහැ. තමන්ගේ යහපත ගැන විතරයි බලන්නේ.

"මහානාමය, යම් කෙනෙක් මේ කටයුතු සියල්ල තමනුත් කරන ගමන් අන් අයත් ඒ සඳහා යොමු කරනවා නම් අන්න ඔහු ආත්මාර්ථය, පරාර්ථය යන දෙපැත්තම සම්පූර්ණ කර ගන්නවා."

උපාසකයකුට ඉතා පුළුල් ජීවන දර්ශනයක් තියෙන්න ඕන බව මේ කරුණුවලින් පැහැදිලි වෙනවා නේද? තමන් විතරක් හැදුනාම ඇති යනුවෙන් නොසිතා තමන් ජීවත්වන සමාජයේ තමා ඇසුරුකරන අනෙක් අයත් ඒ යහපත් අරමුණු කර රැගෙන යන්න උත්සාහ ගන්න ඕන. එහිදී බැනුම් අහන්න දොස් අහන්න සිදු වුණත් ඒවායින් කම්පා නොවී තමන්ගේ සමාජ යුතුකම ඉෂ්ට කරන්න ඕන.

තමන් ජීවත්වන සමාජය නරක නම්, තමන් කොයිතරම් හොඳ වුණත් ඉන්න අමාරුයි. සාමකාමී බව, සැප පහසුව, ජීවිතයේ සතුට ඔහු කරා එන්න නම් ඔහු වටා සිටින පිරිසත් හොඳ අය විය යුතුයි. සමාජයේ හැම දෙනාම හොඳ මගට ගන්න බැරි බව ඇත්තයි. ඒ වුණත් අඩු වැඩි ප්‍රමාණවලින් හොඳ මිනිසුන් බිහිවෙන්න ඒ පුද්ගලයා ගන්නා උත්සාහය බලපානවා. ප්‍රධාන වශයෙන්ම තමාගේ පවුලේ අය, ආසන්න ඤාතීන්, මිත්‍රයන්, අසල්වැසියන්, තමා යටතේ සිටින ශිෂ්‍යයන් ඉහත කී කරුණු ඔස්සේ හොඳ මගට ගන්න උනන්දු වෙන්න ඕන.

උපාසකයෙකුට තමාගේ උපාසක බව වැඩි දියුණු කර ගත හැකි කරුණු දහයක් බුදුහාමුදුරුවෝ පෙන්වා දුන්නා.

I. උපාසකයා සංඝයාට පැමිණෙන දුක් කරදර තමන්ට පැමිණි කරදර සේ සලකා එයින් මිදීමට සංඝයාට උපකාර කළයුතුයි. සංඝයාට සිව්පසය බාධාවකින් තොරව ලැබෙන විට සතුටු විය යුතුයි.

II. උපාසකයා ධර්මය පෙරමුණේ තබාගෙන සියලු කටයුතු කරන්න ඕන. ධර්මානුකූලව ජීවත් වෙන්න දරුවන්ට පුරුදු කරන්න ඕන. මංගල අවමංගල රැකිරක්ෂා ව්‍යාපාර ආදී සියලු කටයුතු ධර්මයට මුල්තැන දී සිදු කරන්න ඕන.

III. තමා සතු සම්පත් තනිව භුක්ති නොවිඳ දෙමව්පියන්, අඹුදරුවන්, මිත්‍රයන්, ඤාතීන්, සේවකයන්, පැවිද්දන් රැකබලා ගන්න පෝෂණය කරන්න හැකි පමණින් විය පැහැදම් කල යුතුයි.

IV. බුදුසසුනේ යම් පිරිහීමක් ඇතිවෙන බව පෙනෙන්ට තියෙනව නම් එය දුරු කරන්නට, සසුන රැකගන්නට මහා සංඝයාට උපකාර කරමින් ක්‍රියා කළ යුතුයි.

V. තෙරුවන් සරණ මිස වෙනත් ක්‍රමවලින් යහපත බලාපොරොත්තු නොවිය යුතුයි. යන්ත්‍ර මන්ත්‍ර ජෝතිෂ්‍ය ආදී ගුප්ත ශස්ත්‍රවලට ගැති නොවිය යුතුයි.

VI. තමන්ගේ ජීවිතය රැකගැනීමේ අදහසින් වත් වෙනත් ආගමකට නොයා යුතුයි. අද සමහරු නිලතල ආදී ලාභ අපේක්ෂාවෙන් අන්‍යාගම්වලට යනවා. එහෙම කළොත් ඔහුගේ උපාසක බව අහෝසි වෙනවා.

VII. කයින් සිදුවන ප්‍රාණඝාත,අදත්තාදාන, කාමමිථ්‍යාචාර, යන අකුසල් තුනෙන් ද, වචනයෙන් සිදුවන මුසාවාද, ඵරුසාවාචා, පිසුණාවාචා, සම්පප්‍රලාප යන අකුසල් හතරෙන්

ද දුරු වෙන්න ඕන.

VIII. ආරවුල් ඇතිකර නොගෙන සියලු දෙනා සමග සහයෝගයෙන්, සමගියෙන් ජීවත් වෙන්න ඕන.

IX. ඉරිසියාව, කුහකම දුරුකළ යුතුයි.

X. ගුණ දැනගෙන තෙරුවන් සරණ යායුතුයි.

මේ විදියට කටයුතු කරන්නා උපාසක රත්නයක් බවත් මේ කිසිවක් නැති, නමට පමණක් උපාසක වන්නා උපාසක චන්ඩාලයකු බවත් බුදුහාමුදුරුවෝ දේශනා කළා.

ඒ වගේම පහත සඳහන් කරුණු අනුගමනය කරනවා නම් ඒ උපාසකයා / උපාසිකාව කවදාවත් පිරිහෙන්නේ නැති බව බුදුහාමුදුරුවෝ වදාළා.

i. භික්ෂූන් හමුවීමට යන ගමන් අත්හරින්න එපා.

ii. බණ අහන එක ප්‍රමාද කරන්න එපා.

iii. පන්සිල්වලින් තෘප්තිමත් නොවී අටසිල්, දස සිල් වැනි උසස් සීලයන් රැකීමටත් යොමු වෙන්න ඕන.

iv. ස්ථවිර, මධ්‍යම, නවක සියලු භික්ෂූන් කෙරෙහි පැහැදීම ඇතිකර ගන්න.

v. හාමුදුරුවරුන් බණ කියන කොට සමහර විට වරදින තැන්, අමතක වුණු තැන් තියෙනවා. ඒ වගේ වැරදි හොයන්න හිතාගෙන බණ අහන්න එපා. එහෙම ඇහුවොත් ධර්මය වැටහෙන්නේ නැහැ. පින් වෙනුවට පව් රැස් වෙනවා.

vi. අනුත්තර පින් කෙතක් බඳු ගිහි ජනතාව කරන පුද පූජා පිළිගැනීමට සුදුසු වන්නේ බුදුරජාණන් වහන්සේ ඇතුළු ආර්ය සංඝ රත්නයයි. මේ ශාසනයෙන් පිටස්තරව දන් පිළිගැන්වීමට එබඳු උතුම් අය සොයන්න යන්න එපා.

vii. සියලුම සිරිත් විරිත් වතාවත් මේ බුදුසසුනට ගැලපෙන ඒවා විය යුතුයි.

ඉතින් පින්වතුනි, පේනවා නේද උපාසක බවට පත්වෙනවා කියන්නේ පහසු වැඩක් නොවන බව. ඔබත් මේ කරුණු තේරුම් ගෙන නියම උපාසකයකු / උපාසිකාවක බවට පත්වීමට උත්සාහ ගන්න.

ඔබ සැමට තෙරුවන් සරණයි!